# බස්නාහිර පළාත් ආයුර්වේද දෙපාර්තමේන්තුවේ ප්‍රාථමික - ශිල්පීය නොවන සේවා ගණයේ (PL01) තනතුරු වලට අදාල පළමුවන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය(වාචික) සඳහා අයදුම්පත් කැඳවීමේ නිවේදනය - 2019

බස්නාහිර පළාත් ආයුර්වේද දෙපාර්තමේන්තුවේ ප්‍රාථමික ශිල්පීය නොවන සේවා ගණයේ (PL - 01) ආයුර්වේද සේවා සහායක තනතුර සඳහා අදාල වන පළමු කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය (වාචික) 2019 වර්ෂය සඳහා පළමුවරට පවත්වනු ලබන බව මෙයින් නිවේදනය කරනු ලැබේ. එම පරීක්ෂණය පවත්වනු ලබන ස්ථානය හා වේලාව ප්‍රවේශ පත්‍රයේ සඳහන් කරනු ඇත.

02. සුදුසුකම්

මෙම විභාගයට අයදුම්කල හැක්කේ ආයුර්වේද සේවා සහායක තනතුරේ III ශ්‍රේණියේ පත්වීම් ලබා ඇති මෙතෙක් පළමුවන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය සම්පූර්ණ කර නොමැති සේවක මහත්ම මහත්මීන්ට පමණි.

තවද අයදුම්පත් භාර ගන්නා අවසන් දිනය වන 2019.05.31 වේ.

03. අයදුම්පත් කැඳවීම.

මෙම නිවේදනය අවසානයේ දක්වා ඇති ආකෘතිය අනුව අයදුම්කරුවන් විසින් සකස් කර ගත යුතු අයදුම්පත් ආයතන ප්‍රධානියා මඟින් 2019.05.31 දින හෝ ඊට පෙර ලැබෙන සේ මා වෙත එවිය යුතුය.ඒ සමඟ පත්වීම් ලිපියේ සහතික කරන ලද පිටපතක් ද එවිය යුතුය.සෑම අයදුම්පතකම දක්වා ඇති තොරතුරු නිවැරදි බව ආයතන ප්‍රධානියා විසින් සහතික කර තිබිය යුතුය. ප්‍රමාද වී ලැබෙන අයදුම්පත් ද, අසම්පූර්ණ හෝ වැරදි සහිත වන අයදුම්පත් ද නැවත දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ.

සැ.යු. ආදර්ශ අයදුම්පතෙහි ආකෘතිය අනුව, අයදුම්පත්‍රය එකම කඩදාසියක දෙපැත්ත භාවිතා කරමින් පළමු පිටුවේ අංක 01 සිට 09 දක්වාත් දෙවන පිටුවේ 10 සිට 12 දක්වාත් සකස් කළ යුතුය. ඉහත ආකෘතියට අනුකූල නොවන සියළුම අයදුම්පත්‍ර නැවත දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ.

04. විභාගයට ඇතුලත් කර ගැනීම.

I. පිළිගත් අයදුම්පත් සඳහා අපේක්ෂකයන්ට ප්‍රවේශපත්‍ර නිකුත් කරනු ලැබේ. එම ප්‍රවේශපත්‍ර නියමිත පරිදි සම්පූර්ණ කර ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය වෙත ඉදිරිපත් කළ යුතුය. එසේ නොමැතිව පරීක්ෂණයට පෙනී සිටීමට ඉඩ දෙනු නොලැබේ.

II. විභාග අපේක්ෂක/ අපේක්ෂිකාවන් විසින් ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයට පෙර ස්වකීය අනන්‍යතාවය තහවුරු කල යුතුය. ඒ සඳහා පහත දැක්වෙන ලියවිලි අතුරින් එකක් ඉදිරිපත් කළ යුතුය.

(අ) ජාතික හැඳුනුම්පත
(ආ) දෙපාර්තමේන්තුව මඟින් නිකුත් කරනු ලබන හැඳුනුම්පත
(ආ) වලංගු රියදුරු බලපත්‍රය
(ඇ) වලංගු විදේශ ගමන් බලපත්‍රය

05. විෂයය නිර්දේශය

වාචික ස්වරූපයේ ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයකි.

| ප්‍රශ්ණ පත්‍රය | විෂය නිර්දේශය | මුළු ලකුණු | සමත් ලකුණු |
|---|---|---|---|
| සාමාන්‍ය පරිපාලනය | i. අදාල සේවකයා ආයතනයට පැවරෙන කාර්යයන් පිළිබඳව අවශ්‍ය පරිදි දැනුම ලබා ඇත් දැයි මැන බැලීම.<br>ii. සාමාන්‍ය කාර්යාල ක්‍රම හා ආයතන පරිපාලන ක්‍රමවේදයන් පිළිබඳ අවබෝධය (පත්වීම් බලධාරිත්වය, නිවාඩු, නිවාඩු දුම්රිය බලපත්, වැටුප්, අතිකාල දීමනා හා සාමාන්‍ය හැසිරීම)<br>iii. තනතුරට පැවරෙන විවිධ කාර්යයන් පිළිබඳව ප්‍රමාණවත් දැනුමක් සහ ප්‍රවීණතාවක් අත් පත් කරගෙන කරගෙන ඇත් දැයි මැන බැලීම. | 100 | 40 |

06. පළමුවන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය සම්බන්ධ රෙගුලාසි අනුගමනය කිරීම

මෙම විභාගය සම්බන්ධව බස්නාහිර පළාත් සෞඛ්‍ය, දේශීය වෛද්‍ය, සමාජ සුබ සාධන, පරිවාස හා ළමාරක්ෂක සේවා, කාන්තා කටයුතු හා සභා කටයුතු අමාත්‍යාංශයේ ලේකම් විසින් නියම කරන ලද නීතිරීති වලට විභාග අපේක්ෂකයින් යටත් වේ. මෙම නීති උල්ලංඝනය කළහොත් විනය බලධරයා විසින් පනවනු ලබන දඬුවමකට යටත් වීමට ඔවුනට සිදුවනවා ඇත. තවද ජංගම දුරකථන හා ඒ හා සමාන සන්නිවේදන හා විද්‍යුත් උපකරණ ද භාවිතා කිරීමෙන් වැළකී සිටිය යුතුය.

07. මෙම තොරතුරු බස්නාහිර පළාත් සෞඛ්‍ය අමාත්‍යාංශයේ වෙබ් අඩවියෙන් ද ලබා ගත හැකිය. www.healthmin.wp.gov.lk

මෙම නිවේදනය සම්බන්ධයෙන් විධිවිධාන සලසා නොමැති කවර කරුණක් පිළිබඳ වුවද, බස්නාහිර පළාත් සෞඛ්‍ය, දේශීය වෛද්‍ය, සමාජ සුබ සාධන, පරිවාස හා ළමාරක්ෂක සේවා, කාන්තා කටයුතු හා සභා කටයුතු අමාත්‍යාංශ ලේකම්ගේ තීරණය අවසාන තීරණය වන්නේය.

එච්.ජී.ජී.ජේ. ධර්මසේන
ලේකම්,
සෞඛ්‍ය, දේශීය වෛද්‍ය, සමාජ සුබ සාධන,
පරිවාස හා ළමාරක්ෂක සේවා, කාන්තා කටයුතු
හා සභා කටයුතු අමාත්‍යාංශය (බ.ප.)